# City NEWS

MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නිළ ඊ පුවත් පත

කලාපය 06

2023 අප්‍රේල් 01


නව ගමනක් අරඹන්නයි හිරු හෙම්හිට සැරසෙන්නේ
ළමා ලපටි, සියළු දනන් සිත්වල මල් පූදින්නේ
ගස්වල මල් ගෙඩි පිරිලා නැවුම් ලොවක සිරි දෙන්නේ
නව අවුරුදු උදා වෙලයි හැම ජීවිත ජය වෙන්නේ

(පබැදුම - දිලිනි කෞෂල්‍යා)



# කොළඹ ගොඩනැඟිලි 10ක ඉදිකිරීම් අතරමග

## තීරණයක් ගන්න ඇමති ප්‍රසන්න ලේකම්ට බලය පවරයි..

(නාලක දහනායක)

නාගරික සංවර්ධන අධිකාරියේ අවසරය මත කොළඹ නගරයේ ඉදිකිරීම් ආරම්භ කොට ඉදිකිරීම් අවසන් කර නොමැතිව අතහැර දමා තිබෙන ගොඩනැඟිලි 10ක් පමණ මේ වනවිට හඳුනාගෙන ඇතැයි නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

අමාත්‍යවරයා පවසන්නේ කොළඹ නගරයේ ඉතාම ඉහළ වාණිජ වටිනාකමක් සහිත භූමි ප්‍රදේශයක ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබෙන ක්‍රිෂ්,හයට් හෝටලය වැනි ඉදිකිරීම් නිසාවෙන් විශාල පාඩුවක් සිදුවන බවයි.

පිටුව 02

# UDA නව සංවර්ධන සැලසුම් හා රෙගුලාසි පිළිබඳව පළාත් පාලන ආයතන දැනුවත් කෙරේ

(නිහාර චාමික පෙරේරා)

නාගරික සංවර්ධන අධිකාරියේ නව සංවර්ධන සැලසුම් හා රෙගුලාසි පිළිබඳව පළාත් පාලන ආයතනවල නිළධාරීන් දැනුවත් කිරීම ඇරඹෙයි.

ඒ අනුව දිවයිනේ පළාත් පාලන ආයතන 341 සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

මෙහි පළමු වැඩමුළුව හොරණ නගර සභාව, හොරණ ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල ප්‍රාදේශීය සභාව සහ මදුරාවල ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන හතරෙහි නිළධාරීන් වෙනුවෙන් පසුගියදා සංවිධානය කර තිබුණි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ.

නාගරික සංවර්ධන අධිකාරියේ නව සංවර්ධන සැලසුම් හා රෙගුලාසි පිළිබඳව පළාත් පාලන ආයතනවල නිළධාරීන් දැනුවත් කිරීම සහ ඔවුන් මුහුණ දෙන ගැටළු නිරාකරණය කර ගැනීමට සහය වීම මෙම වැඩමුළුවේ අරමුණයි.

# අඩු ආදායම්ලාභීන් සහ කලාකරුවන් සඳහා නිවාස 1,996ක්

(අමිල දර්ශන හේරත්)

අඩු ආදායම්ලාභීන් සහ කලාකරුවන් සඳහා නිවාස 1,996 ක් ඉදිකිරීමට චීනය සමග ගිවිසුම් ගතවීම ඉදිරි සති කිහිපය තුළ සිදු කෙරෙන බව නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.


ඒ සඳහා වන මූලික එකගතාව සඳහා අත්සන් තැබීම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් සහ චීන රජය වෙනුවෙන් සෙන්ට්‍රල් සවුත් ආකිටෙක්චරල් ඩිසයින් ඉන්සිටියුට් කෝපරේෂන් ලිමිටඩ් ආයතනයේ ලේකම් ෂෙන් ටාඕ මහත්වරුන් අතර පසුගියදා සිදුවිය.

පිටුව 02

සිංහල - බෞද්ධ සහ දෙමළ - හින්දු ජන කොටස් පමණක් නොව මුළුමහත් ලාංකේය ජාතියම ඒකාත්මික කරමින් සිංහල හා හින්දු අලුත් අවුරුද්ද උදාවේ. මේ උදාවන්නේ ලාංකික ජන සමාජය තුළ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීමට හැකි තිරෝගිමත් නව වසරකි.

ශක්තිමත් දේශීය ආර්ථිකයක් ගොඩනගා ගැනීම මේ මොහොතේ අප ඉදිරියේ ඇති ලොකුම අභියෝගයයි. අනාගත දරු පරපුරේ බලාපොරොත්තු මල්වල ගන්වනු වස් සූවෙන් පිරි ශක්තිමත් දේශයක් ගොඩ නැඟීමට මේ සිංහල හා හින්දු අලුත් අවුරුද්දේදී අපි අදිටන් කර ගනිමු.

අලුත් බලාපොරොත්තු අහුරක් අරන් හෙට අලුත් ඉරක් පායනු ඇත. නිදා නොසිට අවි ගසා නැගිටිමු. එවිට අනාගතය තවත් වර්ණවත්වනු ඇත.



**ප්‍රසන්න රණතුංග**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක

# නිවාස ණය ගෙවන්න තත්ත්වය යහපත්

## මෙම වසරේ නිවාස ඒකක 1000ක් හදන්න මිලියන 600ක්

(අමිල දර්ශන හේරත්)

නිවාස සංවර්ධන අධිකරියෙන් නිවාස මිලදී ගත් ජනතාවගෙන් ඒ සඳහා වාරික අයකිරීමේදී යම් සහනයක් ලබාදෙන ලෙසට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස් දුන්නේය.

පසුගිය සමයේදී රට මුහුණ දුන් කොවිඩ් වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුධ හේතුවෙන් ජනතාවගේ ආදායම් තත්ත්වය පහත වැටී ඇත. අමාත්‍යවරයා පවසන්නේ ජනතාවගෙන් නිවාස ණය වාරික අය කිරීමේදී යම් සහනාදායි ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙසයි.

පිටුව 02

නාගරික සංවර්ධන හා
නිවාස අමාත්‍යාංශයේ
City News නිළ ඊ පුවත්පත
සඳහා පිවිසෙන්න

# කතා වැකිය



අලුත් රටක...
අලුත් සමාජයක...
අලුත් කියවීමක්...
අලුත් දැක්මක් සහිත ...
අලුත් මිනිසකු බිහිවන...
අලුත් අවුරුද්දක්ම වේවා...
ඔබ සැමට...

**උපදේශකත්වය**
ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම්
ප්‍රදීප් අනුර කුමාර
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**සංස්කරණය**
නාලක දහනායක
අමිල දර්ශන හේරත්

**පිටු සැකසුම**
ධනුෂිකා කුමාරි

**විශේෂාංග ලිපි**
නාලක දහනායක
නිහාර චාමික පෙරේරා
අමිල දර්ශන හේරත්
මුනීරා අබු බක්කර්

**සෝදුපත් බැලීම**
පී.බී.එස්. සම්පත්

**සම්බන්ධීකරණය**
දිලිනි කෞෂල්‍යා
නදුන් තාරක
නිලංක නිරෝෂන්

**ඡායාරූප**
නුවන් දිනේන්ද්‍ර
නලින් හේවාපතිරණ

**පරිගණක සහය**
සචිදු සංකල්ප
තිළිණ නිර්මාල්

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල
94 11 286 7163
94 11 286 5479
paper.citynews@gmail.com



## අඩු ආදායම්ලාභීන් සහ කලාකරුවන් සඳහා නිවාස 1,996 ක්

අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස 1,996 ක් ඉදිකිරීම වෙනුවෙන් චීන රජය යුවාන් මිලියන 552 ක ආධාරයක් (රුපියල් බිලියන 29 ක්) ලබා දීමට නියමිතයි. ස්ථාන 5 ක මෙම නිවාස ව්‍යාපෘති ඉදිකිරීමට නියමිතය. පෑලියගොඩ, දෙමටගොඩ, කොට්ටාව, මහරගම සහ මොරටුව යන නාගරික ප්‍රදේශ ඒ සදහා තෝරා ගෙන ඇත.

මෙම නිවාස ව්‍යාපෘති 5 න් කොට්ටාව නිවාස ව්‍යාපෘතිය මෙරට ජ්‍යෙෂ්ට කලාකරුවන් සදහා වෙන් කර තිබේ. එහි ඉදි කෙරෙන නිවාස සංඛ්‍යාව 108 කි. නිවසක ප්‍රමාණය වර්ග අඩි 750 කි. අනෙක් ව්‍යාපෘති 4 අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වෙන් කර ඇති අතර එහි ඉදි කෙරෙන නිවාස සංඛ්‍යාව 1,888 කි. මෙහි නිවසක් වර්ග අඩි 530 කින් යුක්ත වේ. මෙම වසර අවසන් වීමට පෙර මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවද නාගරික සංවර්ධන අධිකාරිය සදහන් කරයි.

## මෙම වසරේ නිවාස ඒකක 1000ක් හදන්න මිලියන 600ක්

එහෙත් එම සහනදායි ක්‍රමවේදය අනුගමනය කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය අංශයට හානියක් නොවිය යුතු බවද අමාත්‍යවරයා අවධාරණය කළේය.

මෙම වසරේදී නිවාස ඒකක 1000ක් ඉදිකිරීමට රුපියල් මිලියන 600ක මුදලක් වෙන්කර ඇතැයි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවසයි.

එමගින් නව නිවාස ඉදිකිරීමට හෝ දැනට ඉදිකර ඇති නිවාස වැඩිදියුණු කරගැනීමට ජනතාවට හැකියාව ලැබෙන බවද එම අධිකාරිය සඳහන් කරයි.

## කොළඹ ගොඩනැඟිලි

එබැවින් අත්හැරදමා ඇති එවැනි ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර කඩිනමින් තීරණයක් ගන්නා ලෙස පසුගියදා පාර්ලිමේන්තුවේදී පැවැති අමාත්‍යංශ උපදේශක කාරක සභාවේදී අමාත්‍යවරයා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම්වරය-ාට උපදෙස් දුන්නේය.

අමාත්‍යංශ ලේකම්වරයා විසින් ලබාදෙනු ලබන එම නිර්දේශ කැබිනට් මණ්ඩලයට ද ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බවද අමාත්‍යවරයා පැවසීය.

# 2023 සිංහල අවුරුදු චාරිත්‍ර

## නව සඳ බැලීම

අභිනව චන්ද්‍ර වර්ෂය සදහා මාර්තු මස 23වන බ්‍රහස්පතින්දා දින ද අභිනව සූර්ය වර්ෂය සදහා අප්‍රේල් මස 23 වන ඉරිදා දින ද නව සද බැලීම මැනවි.

## පරණ අවුරුද්ද සඳහා ස්නනයට

අප්‍රේල් මස 12 වෙන බදාදා දින කොහොඹපත් යුෂ මිශ්‍ර නානු හා ස්නානය කොට ඉෂ්ට දේවතා අනුස්මරණයෙහි යෙදී වාසය මැනවි.

## අලුත් අවුරුදු උදාව

අප්‍රේල් මස 14 වෙනි සිකුරාදා දින අපර භාග 2.59ට සිංහල අලුත් අවුරුද්ද උදා වේ.

## පුණ්‍ය කාලය

අප්‍රේල් මස 14වන සිකුරාදා පූර්ව භාග 8.35 සිට එදින අපර භාග 9.23 දක්වා පුණ්‍ය කාලය බැවින් අප්‍රේල මස 14 වන සිකුරාදා දින පූර්ව භාග 8.35ට පළමුව ආහාර පාන ගෙන සියලු වැඩ අත්හැර ආගමික වතාවත්වල යෙදීම ද පුණ්‍ය කාලයේ අපර කොටස තුළ එනම්, 14 වන සිකුරාදා දින අපර භාර 2.59 සිට අපර භාග 9.23 දක්වා කාලය තුළ පහත දැක්වෙන අයුරින් ආහාර පිසීම, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය ආදී නැකත් චාරිත්‍ර විධි ඉටු කිරීම ද මැනවි.

## ආහාර පිසීම

අප්‍රේල් මස 14 වෙනි සිකුරාදා අපර භාග 3.29ට විචිත්‍ර වර්ණ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා ළිප් බැද, ගිනි මොළවා, දීකිරි මිශ්‍ර කිරිබතක් ද තල සහ විළද මිශ්‍ර කැවිලි වර්ගයක් ද පිළියෙල කරගැනීම මැනවි.

## වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරම හා ආහාර අනුභවය

අප්‍රේල් මස 14 වෙනි සිකුරාදා අපර භාග 5.05ට විචිත්‍ර වර්ණ පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී දකුණු දිශාව බලා සියලු වැඩ අල්ලා ගනුදෙනු කොට ආහාර අනුභවය මැනවි.

## හිසතෙල් ගෑම

අප්‍රේල් මස 16 වෙනි ඉරිදා උදේ 9.41ට රතු සහ කහ මිශ්‍ර වර්ණ (තඹ පැහැති) වස්ත්‍රාභරණයෙන් සැරසී, දකුණු දිශාව බලා හිසට ඉඹුල් පත් ද පයට නුග පත් ද තබා ඉඹුල් පත් යුෂ මිශ්‍ර නානු ද තෙල් ද ගා ස්නානය කිරීම මැනවි.

## රැකීරක්ෂා සඳහා පිටත්ව යෑම

අප්‍රේල් මස 17 වන සදුදා උදේ 6.28 සුදු පැහැති වස්ත්‍රාභරණයෙන් සැරසී, දීකිරි මිශ්‍ර කිරිබතක් සහ කැවිලි වර්ගයක් අනුභව කර දකුණු දිශාව බලා පිටත්ව යෑම මැනවි.

# UDA ISO 9001:2015 තත්ත්ව සහතිකය මානව සම්පත් අංශයට



**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නාගරික සංවර්ධන අධිකාරියේ මානව සම්පත් කළමනාකරණ අංශයට ISO 9001 : 2015 තත්ත්ව සහතිකය ලබා දීම පිළිබඳ UDA නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන) ඩබ්ලිව්.ඒ.එස්. සුමනසූරිය මහතා සමග කළ සාකච්ඡාව.**

නාගරික සංවර්ධන අධිකාරිය ආරම්භ වන්නේ 1978 පාර්ලිමේන්තු පනතකින්. ප්‍රධාන වශයෙන් මෙම අධිකාරියේ අරමුණ සහ කාර්යභාරය වන්නේ මහජනතාවට පහසුවෙන් ජීවත් විය හැකි ආකාරයට නගර නිර්මාණය කිරීම සහ මහජනතාවගේ ජීවිතයට හානියක් නොවන ආකාරයට නගර නිර්මාණය පහසු කිරීමයි. මේ කාර්යභාරය ඉටු කිරීමට මූලිකව නාගරික සංවර්ධන අධිකාරිය සමස්තයක් ලෙස ලංකාව පුරා පළාත් 9 ආවරණය වන පරිදි පළාත් කාර්යාල 9 කින් දිස්ත්‍රික් කාර්යාල 26 කින් සමන්විතයි. මෙම ව්‍යුහය අනුව නාගරික සංවර්ධන අධිකාරියේ කටයුතු සහ නගර සැලසුම් කටයුතු සිදු වන්නේ.

මෙම නගර සැලසුම් කටයුතු ක්‍රියාත්මක වන විට යම් යම් ගැටළුකාරී තත්ත්වයන් සඳහා සහ මහජනයාට අවශ්‍ය කරන සේවාව අඛන්ඩව ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් පවත්වා ගෙන යාම අවශ්‍ය වනවා. මෙම නිසි ක්‍රමවේදයක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මතු වන්නේ විවිධාකාරයෙන් මතු වන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි මූලික කරගනිමින්. මෙම කරුණු කාරණා සමග මහජන දිනයේදී අපේ ඇමතිතුමා මහජන පැමිණිලිවලට සවන් දීම මුල් කරගනිමින් මහජන පහසුව ඇති වන ආකාරයට ඵලදායි ලෙස ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කර දෙන්න හොඳ ක්‍රමවේදයක් සකස් කිරීමේ වැදගත්කම අපට පෙන්වා දුන්නා. ඒ අනුව තමයි අපි තීරණය කරන්නේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය S0PS සකස් කරන්න. මහජනතාවගේ අවශ්‍යතාවන් වලට, ගැටළුවලට යම්කිසි ආකාරයකින් ක්ෂණික පිළිතුරු ලබා දෙන්න. ඒ වගේම මහජන අවශ්‍යතාවන් ඉටුකිරීමේදී අපිට ආයතනය අභ්‍යන්තරයේ විවිධ ක්‍රියාකාරකම් කරන්න වෙනවා.

ISO එකෙන් කරන්නේ ලෝකයේ සම්මතයක් ලෙස පොදුවේ පිළිගත් සම්මත ක්‍රියා පටිපාටීන් නැත්නම් අන්තර්ජාතික ක්‍රමවේදයන් අනුව අපේ ආයතනික ක්‍රියාකාරකම් සිදු වනවාද නැද්ද විමසා බලා එම අන්තර්ජාතික ක්‍රමවේදවලට අනුව ආයතනයේ ක්‍රියාපටිපාටීන් සිදු වෙනවා කියන සහතිකය ලබා දීමයි. එතැනදී ඔවුන් බලනවා අපේ ක්‍රමවේද ජාත්‍යන්තර ක්‍රමවේද සමග අනුගත වෙලාද කියන කාරණය. අපේ අඩුපාඩු තියෙනවා නම් ඒවා අපිට නැවත හදා ගන්න සිදු වෙනවා. ඊට පස්සේ ජාත්‍යන්තර ක්‍රමවේද සමග අපේ ආයතනයේ ක්‍රමවේද සකස් වී තිබෙන බවට තහවුරු වුණාට පසුවයි. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ISO 9001 සහතිකය ලබා දෙන්නේ.

අපේ ඊළග අරමුණ වන්නේ නාගරික සංවර්ධන අධිකාරියටම මෙම ISO සහතිකය ලබා ගැනීමයි . ඒ කියන්නේ ජාත්‍යන්තරව පිළිගත් සම්මත ක්‍රියාපටිපාටිය හඳුන්වා දීමයි. ඒ සඳහා අපි මූලිකත්වය ගත්තේ මානව සම්පත් කළමනාකරණ අංශයෙන්. ඒ අනුව බඳවා ගැනීම්, තෝරා ගැනීම්, උසස් වීම්, වැටුප්, පුහුණුව හා සංවර්ධනය ආදී සියලු දේ සඳහා ජාත්‍යන්තරව පිළිගත් සම්මත ක්‍රමවේදයන් සකස් කර තියෙනවා. ඒ සඳහා අපට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අනුමැතිය ලැබී තිබෙනවා. ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයන්ට අනුකූලව අපි අනුගත වී අවසන්. අනෙක් අංශ වලටත් අභිප්‍රේරණයක් ඇති කිරිමට අපි මේකෙන් බලාපොරොත්තු වෙනවා.

> **“ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන මානව සම්පත් කළමණාකරණ ක්‍රමවේදයන්ට අනුකූලව අපි අනුගත වී අවසන්.”**

මෙහි ඊළග පියවර වන්නේ අපේ සෑම පළාත් කාර්යාලයකටම මෙම සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් හඳුන්වා දී මෙම ISO සහතිකය ලබා දීමයි. එමගින් අපිට වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මහජන සේවයක් ලබා දීමේ හැකියාව තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම්, නිවාස, තොරතුරු තාක්ෂණ සහ වන් ස්ටොප් යුනිට් යන අංශවලට දැනටමත් මෙහි මූලික කටයුතු පටන් අරගෙන තිබෙනවා.

> **“අපේ ඊළග අරමුණ වන්නේ නාගරික සංවර්ධන අධිකාරියටම මෙම ISO සහතිකය ලබා ගැනීමයි.”**

ඉන් පසුව මේ මාසය අවසන් වීමට පෙර යාපනය, සබරගමුව, දකුණු පළාත් කාර්යාල වලටත් මෙම කටයුත්ත පටන් ගන්නවා. වසර අවසන් වෙන්නට පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සෑම කාර්යාලයකටම අපි ජාත්‍යන්තරව පිළිගත් මෙහෙයුම් ක්‍රියාපටිපාටිය හඳුන්වා දී ඒ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් අනුමැතිය අරගෙන ISO සහතිකය ලබා ගන්නට කටයුතු කරනවා.

ISO සහතිකය ලබා ගැනීම සඳහා මුලින්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් ඉල්ලීමක් කළ යුතුයි. පසුව ඔවුන් ඇවිත් බලනවා ආයතනයේ ක්‍රියාපටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මෙහෙයුම් ක්‍රියාපටිපාටිය අනුව තිබෙනවාද නැද්ද කියලා. එය තහවුරු කර ගැනීමෙන් පසුව තමයි මෙම සහතිකය ලබා දෙන්නේ. ඒ සඳහා ආයතනයේ සේවකයින්ගේ කැපවීම වගේම මනා නායකත්වය අවශ්‍යයි. නිවැරදි නායකත්වය තිබෙනවා නම් තමයි මෙම කටයුත්ත සාර්ථක කර ගන්න පුළුවන් වෙන්නේ. සාර්ථක ව්‍යාපාරයක් හෝ අසාර්ථක ව්‍යාපාරයක් බිහිවීමට බලපාන සාධකය වන්නේ නායකත්වයයි. අපිට මෙම තත්ත්ව සහතිකය ලබා ගන්න මාස 6 ක් වැනි කාලයක් ගත වුණා. ඒ සඳහා සභාපතිතුමාගෙන් වගේම ඇමතිතුමාගෙන් ලැබුණු සහයෝගය විශිෂ්ටයි.

නිහාර චාමික පෙරේරා



# නාගරික අඩු පහසුකම් ජනාවාසවල දරුවන්ට UNICEF අතහිත

නාගරික ජනාවාස ආශ්‍රිතව ජීවත්වන දරුවන්ගේ අධ්‍යාපන හා සෞඛ්‍යය තත්ත්වය වැඩිදියුණු කිරීමට විශේෂ අවධානයක් අප යොමු කළ යුතුය. ඊට ප්‍රධාන හේතුව වන්නේ වර්තමානයේ නාගරික ජනාවාස ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ජාවාරම ඇතුළු සමාජ විෂමාචාර ක්‍රියාවන් වැඩි වී තිබීමයි. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ඇති නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඒ සඳහා පෙරමුණ ගෙන තිබේ.

ඒ අනුව නාගරික අඩුපහසුකම් ජනාවාස ආශ්‍රිතව ජීවත්වන දරුවන්ගේ සෞඛ්‍යය ප්‍රවර්ධනය, බෝවන රෝග පාලනය කිරීම සහ ඔවුන්ගේ සනීපාරක්ෂාව වෙනුවෙන් විශේෂ වැඩසටහනක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබේ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF), සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සහ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාවට නංවයි.

මෙම වැඩසටහන යටතේ "සුවෙන් සිටිමු - ලස්සන වෙමු" සහ "සුවැති දියණිය" යන ග්‍රන්ථ ද්විත්වය එළිදැක්වීමද පසුගියදා බත්තරමුල්ල, සෙත්සිරිපාය පරිශ්‍රයේදී සිදු කෙරිණ. "සුවෙන් සිටිමු - ලස්සන වෙමු" ග්‍රන්ථයෙන් නව යෞවන යෞවනියන්ගේ දැත් පිරිසිදු කිරීම හා මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම පිළිබඳවත්, "සුවැති දියණිය" ග්‍රන්ථයෙන් නව යෞවනියන්ගේ සනීපාරක්ෂාව පිළිබඳවත් අන්තර්ගත වේ.



නාගරික අඩුපහසුකම් ජනාවාසවල ජීවත්වන දරුවන් 3,000 කට අදියර 10 ක් යටතේ සනීපාරක්ෂක උපකරණ කට්ටල ලබා දීමද මේ යටතේ සිදු කෙරේ. ඒ සඳහා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් ප්‍රදානය කර ඇති මුදල රුපියල් මිලියන 5.7 කි. ඉන් දරුවන් 200 දෙනෙකු සඳහා සනීපාරක්ෂක උපකරණ කට්ටල ප්‍රදානය කිරීම පසුගියදා අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණ. එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලේ දේශීය නිත්‍ය නියෝජිත ටකහෝ ෆුකාමි මහත්මියද මෙම අවස්ථාවට එක් විය.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ දිවයිනපුරා ක්‍රියාත්මක නාගරික ජනාවාස සංඛ්‍යාව 22 කි. කොළඹ, ගම්පහ, කඩුවෙල, අනුරාධපුර, මහියංගණ ආශ්‍රිතව ඒවා ක්‍රියාත්මකය. මෙම ජනාවාස ආශ්‍රිතව සෞඛ්‍ය ප්‍රවර්ධන, අධ්‍යාපනික, ප්‍රජා ක්‍රියාකාරී, ආගමික හා සංස්කෘතික වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සැලසුම් කර තිබේ. ජපන් භාෂාව ඇතුළු භාෂා ප්‍රවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, ප්‍රජා සමිති ස්ථාපිත කිරීම්, පරිසර වැඩසටහන් සහ සංස්කෘතික වැඩසටහන් ආදිය ඒ යටතේ ක්‍රියත්මක වේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්ලියු.එස් සත්‍යානන්ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වතු හා නාගරික අංශයේ විශේෂඥ ප්‍රජා වෛද්‍ය උපුලි පෙරේරා, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය අශාන්ති බලපිටිය, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත්, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති ප්‍රියන්ත රත්නායක, අධ්‍යක්ෂ ජනරාල් විජයානන්ද හේරත් යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මේ සඳහා සහභාගී වූහ.



නිහාර චාමික පෙරේරා

# කාන්තාවකට වඩාත් වැදගත් වන්නේ

## මනා අධ්‍යාපනය හා ආර්ථිකය ශක්තිමත් බවයි.



ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් බෞද්ධ වන ශ්‍රී ලාංකික සමාජයේ පුරවැසියන් වශයෙන් කාන්තාවන් වෙත විමුක්තිය ලබා දීමට කටයුතු කළ ශාස්තෘවරයා බුදු රජාණන් වහන්සේ බව අමුතුවෙන් මතක් කළ යුතු නැත. එවකට ඉන්දියාවේ පැවති ආගමික මතවාද හා සංස්කෘතිය අනුව කාන්තාවකට එම සමාජයේ තිබූ තැන කුමක්දැයි අසා, කියවා ඇති නිසා අපි දන්නෙමු. එවන් සමාජ පසුබිමක් තුළ පවා පැවිදි බව ඉල්ලා පැමිණි මහා ප්‍රජාපතී ගෝතමිය ඇතුළු පිරිස වෙත පැවිදි බව ලබා දීමට එනම්, පිරිමි පමණක් සිටි ශාසනය තුළට කාන්තාවන් ද ඇතුල් කර ගැනීම තුළින් කාන්තාවන් වෙත විමුක්තිය ලබා දීමට බුදුන් වහන්සේ විසින් ගන්නා ලද තීරණය එදා පැවති සමාජය හා බලන කල රැඩිකල් තීරණයකි.

බුදුන් වහන්සේ පිරිනිවන් පා මාස තුනකින් පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට සිදු විය. බුදුන් සමඟ එකට සිටි රහතන් වහන්සේලා පවා ජීවත්ව සිටියදීම මාස තුනක් තුළ පළමු ධර්ම සංගායනාවක් පැවැත්වීමට තරම් පිරිහීමක් ඇති වූවා නම් වසර 2500 කට පසු අදවන විට එම ධර්මය තුළට කොතෙකුත් නම් විකෘති එක් වී තිබිය හැකිද? කාන්තා විමුක්තිය හා කාන්තාව සමතැන්හි ලා සැලකීම යන කාරණයට අවධානය යොමු කළහොත් විවෘත මනසකින් යුක්තව සවන් දෙනවා නම් අද ඇතැම් ධර්ම දේශනා තුළ ඉදිරිපත් කරන විකෘති කිරීම් මනාව හඳුනාගැනීමට හැකිවනු ඇත.



ජීව විද්‍යාත්මකව "ගැහැණු" ශරීරයක් ලැබීම පවක් බව, පහත් කොට සැලකීමට හේතුවක් බව පවසන වැඩසටහන්වලට ඔබේ දියණිය, සොයුරිය සහභාගී කරවන්නේ නම් එය මනස වැඩෙන අවධියේ සිටින ඇයගේ පෞරුෂ වර්ධනයට සිදු කරන හානියකි. යුවතියක් වීම නිසාම හෝ ඇය ඇඳ සිටින ඇඳුම නිසා ඇයව පිරිසක් මැද හාස්‍යයට ලක්කරන වැඩසටහන්වලින් සිදු වන්නේ ද පෞරුෂ වර්ධන හානියකි. ජීව විද්‍යාත්මකව ශරීරයේ ඇති වෙනස්කම් හඳුනා ගැනීමට ඇයට නිවැරදි අධ්‍යාපනයක් ලබා දෙන්න. සීමිත රාමුවක කොටු නොවී ලෝකය දකින්නට ඇයට ඉඩ දෙන්න. "පව" සහ "වෙනස" තේරුම් ගැනීමට හැකිවන පරිදි මනා අධ්‍යාපනයක් ලබා දෙන්න.

හොඳ අම්මා යනු ඉරට කලින් නැගිටින, දර ලිප ළඟ තුන්වේලට බත් තම්බන, කලු වූ නියපොතු හා දැලි තැවරුන ඇඟිලි ද සහිත කිලිටි ඇඳුම් අඳින දුක් විඳින ගැහැණියයි යන මිත්‍යාවෙන් දැන්වත් මිදිය යුතුය. "ගැහැණු" ශරීරයක් සහිතව ඉපදීම සතුටින් ජීවත් වීමට ඇති අයිතිය අහිමි වීමට හේතුවක් නොවේ.

කාන්තාවක් වශයෙන් වඩාත්ම වැදගත් දෙය වන්නේ ඇය ආර්ථිකව ශක්තිමත් වීමයි. කවර කරුණු කාරණා ඉදිරිපත් කරමින් කාන්තාව සතු ඉවසීම, දරා ගැනීම, කැප කිරීමේ ගුණාංග ගැන කතා කළද, කවි ගී ලීවද ආර්ථිකය ශක්තිමත් නොවූ තැන ඇය අන්ත අසරණ ය.

අනෙක් අතට මේ රටේ නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබමින්, එනම්, මහජන මුදලින් අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබා ශ්‍රම බලකායට එක් වී දායකත්වය ලබා නොදෙන්නේ නම් එය රටේ මහජනතාවට කරන අසාධාරණයකි.
එබැවින් සෑම කාන්තාවක්ම,

- සීමිත රාමුවක කොටු නොවී ලෝකය දකින්නට හැකිවන අයුරු මනා අධ්‍යාපනයක් ලබා ගත යුතුම ය.
- ආර්ථිකව ශක්තිමත් විය යුතුම ය.

**තිලිණි සුරංගිකා කරස්නාගොඩ**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

# මේ අවුරුදු කාලේ ...

සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය ළංවත්ම අපිට ඇසෙන්නෙ කොහාගේ නාදයයි. එදා මෙන් අද කොහාගේ නාදය අවට පරිසරයෙන් අපට නෑසුණද රූපවාහිනී දැන්වීම්වලින් හෝ අපට කොහාගේ නාදය ඇසේ. අවුරුදු උදාවෙන් සංකේතවත් කරන්නේ ගැමි සමාජය සොබාදහම සමඟ පැවති සම්බන්ධය යි. එකමුතුව වැඩක් කිරීමේ වැදගත්කම මෙන් ම සශ්‍රීකත්වය ගැන හැඟීමක් ඇති කිරීම ද අවුරුදු සිරිත්වල අරමුණකි.

ප්‍රකට ජනශ්‍රැති පර්යේෂකයකු වන මහින්ද කුමාර දළුපොත මහතා සඳහන් කරන ආකාරයට අද අප අනුගමනය කරන බොහෝ අවුරුදු චාරිත්‍රවලට දිගු ඉතිහාසයක් නැත. ඒවා ගොඩනැඟී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන අවධියේදීය. එකල රට අරාජිකවීමෙන් ගැලවීම සඳහා තිබූ වුවමනාව අලුත් අවුරුද්දේ එකම නැකතට රට පුරා සිරිත් - විරිත් ඉටුකිරීමෙන් ද පිළිබිඹු විය.

**"අවුරුද්දේ ආරම්භක නැකත තෙල් වළං ලිප තබන නැකැතයි. හා හා පුරා නැකතට තෙල් වළං ලිප තැබීම එහිදී සිදුවේ. මෙය වැදගත්ම නැකැතකි. මේ නැකැත උදාවනතුරු මොනම ලෙසකින්වත් අවුරුද්ද අරමුණු කොට කැවිලි තැනීමට නොහැකිය, තෙල් වළං ලිප තැබිය නොහැකිය ආදී වශයෙන් තහංචි පැනවී තිබිණි. එමෙන්ම එය උදාවනතුරු අවුරුදු වෙනුවෙන් ශබ්ද පූජා පැවැත්වීම ද නොකළ යුතු විය. රබන් වයා ශබ්ද පූජා පැවැත්වීම පරිසරය හා බැඳී ඇති ඉතා සංවේදී ප්‍රබල ගුණාංගයකි."**

මහින්ද කුමාර දළුපොත මහතා සඳහන් කරන්නේ රබන් නාදය සහ ගහකොළ එල දැරීම අතර පුදුමාකාර සම්බන්ධයක් පවතින බවයි. එයට හේතුව හඬනංවමින් ක්ෂණික පුපුරායන රතිඤ්ඤා වලින් නැගෙන ශබ්ද හේතුවෙන් මී මැස්සන්, බඹරුන් වැනි සතුන් වහා පලා යාමයි. එමෙන්ම අලියාගේ පටන් තවත් බොහෝ සතුන් ද මේ හඬට බිය වී පලා යති. මී මැස්සන්, බමරුන් පලා යාමෙන් ශාක පරාගන ක්‍රියාවලියට බාධා ඇතිවේ. ඉන් සිදුවන්නේ එල හීනවීමයි. එබැවින් එවැනි සතුන්ට අහිතකර ලෙස බලපාන ශබ්ද පූජා නැකත උදාවනතුරු නොකළ යුතු බව පැරැන්නෝ අත්දැකීමෙන්ම දැන සිටියහ.
එය නොපිළිපැදීමෙන් සිදුවන්නේ ශාකවල මල් පිපී එලදැරීමට සැරසෙන සශ්‍රීක අවුරුදු සමයේ එම ක්‍රියාවලියට බාධා ඇතිවීමයි. තෙල් වළං ලිප තබන නැකැත උදාවනතුරු ශබ්ද පූජා නොකළ යුතු බවට තහංචි පැනවී තිබුණේ මේ කාරණා පිළිබඳ තිබූ දැනුවත්භාවය නිසාය. ශබ්ද පූජාවලට ඉඩ අවසර ලැබුණේ ද පාලනයකින් යුතුවය. ශබ්ද පූජා පමණක් නොව සියල්ල පිළිබඳ පාලනයක් පුරාණයේ තිබිණි.

දුරාතීතයේ පටන් අප අවුරුදු පිළිවෙත් සියල්ල අනුගමනය කළේ ග්‍රාමීය පදනමක් සහිතවය. නැකැත් රාළ විසින් පිළියෙල කොට දුන් නැකැත්වලට අනුව ඒවා සිදුවිය. ඒ ඒ ප්‍රදේශ අනුව එම නැකැත් පිළියෙළ වූයේ දියුණු විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව බව පැහැදිලිය. නිදසුනක් ලෙස කුරුණෑගලට ලිප ගිනි මෙළවීම උදෑසන 7.20 ට නම් දෙවුන්දරට එය 7.16 හෝ 7.22 විය හැකිය. එය 7.20 ම නොවේ. මේ වේලාව තීරණය වන්නේ ඉර මුදුන් වන රටාව අනුවය. ඒ අනුව විනාඩි හෝ තත්පර ගණනක වෙනසක් ඒ ඒ ප්‍රදේශවල නැකැත්වල තිබිණි. එහෙත් එය ගැටලුවක් නොවේ. මේ වන විට පළාත්වලට අනන්‍ය වූ සම්ප්‍රදාය බිඳ වැටී ඇතිඅතර ඒ වෙනුවට රටටම බලපාන පොදු නැකැත් භාවිත කරන්නට පටන්ගෙන ඇත. ඒ සමඟ අවුරුද්දේ පළාත්බද සංස්කෘතික අනන්‍යතාව ද බිඳ වැටිණි.

**"අවුරුද්ද අතිශයින්ම විචිත්‍රය. අවුරුද්දේදී අනුගමනය කරන සංස්කෘතික භාවිතාවේ පළාත්බද සංස්කෘතික අනන්‍යතාව ඒ විචිත්‍ර බව ඔපවත් කරයි. නිදසුනක් ලෙස හැටන්, ඔහිය වැනි ප්‍රදේශවල එක් පැරැණි අවුරුදු චාරිත්‍රයක් වන්නේ ජලය ලබාගන්නා දියකදුරු සමඟ ගනුදෙනු කිරීමයි. එය දියවර ගනු-දෙනු නමින් හැඳින්වේ. දියකදුරු සමඟ ගනුදෙනුව එම ප්‍රදේශ-වලට අනන්‍යය. අනුරාධපුර, පොළොන්නරුව වැනි ප්‍රදේශවලදී නම් දියවර ගනුදෙනු සිදුවන්නේ "වැව" පදනම් කරගනිමින්."**

**ඒ පළාත්වල ඇත්තේ වාපී සංස්කෘතියකි. නමුත් දකුණු පළාතේ එවැන්නක් නැත. දකුණේ දියවර ගනුදෙනු සිදුවූයේ ගංඟා, ඇළ, දොළ සමඟයි. කැලණි ගඟේ පටන් මැණික් ගඟ දක්වා පහළට ගලාබස්නා ගංඟා නිසා දකුණට වැව්වල අවශ්‍යතාවක් නැත. දියවර ගනුදෙනු සඳහා දියමංකඩට යන සිරිත වර්තමානයේදී ළිඳ හෝ වතුර පයිප්පයට මාරු වී තිබේ. ළිඳ කෙසේ වෙතත් වතුර පයිප්පය සමඟ දියවර ගනුදෙනු සිදුක-රන්නේ කෙසේදැයි අද සිටින අයට දැනුමක් නැත. සංස්කෘතික අතරමංවීමක් ඇතිවී තිබේ. එකී අතරමං වීම තුළ අපි බොහෝ පිළිවෙත් අතහැර ඇත්තෙමු."**


**එදා - මෙදා අවුරුදු**
**මහින්ද කුමාර දළුපොත**
**ජනශ්‍රැති පර්යේෂක**



වර්තමානය වනවිට සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සම්පූර්ණයෙන්ම "මොඩ්" වී තිබේ. අප ගරු කළ බොහෝ හෙළ සිරිත් විරිත් සූළඟේ ගසාගෙන ගොසිනි. ලිප් ගිනි මෙළවීම, වැඩ ඇල්ලීම, ආහාර අනුභවය ආදී වශයෙන් අද අප අනුගමනය කරන අවුරුදු චාරිත්‍ර එකම නැකතකට සිදුකර ජාතික හැඟීමක්, අභිමානයක් ඇතිකිරීම ගැන අවධානය යොමු කෙරිණි. අද අවුරුද්ද දෙදිනකට සීමා කෙරුණ ද පැරැන්නෝ එය දින 2 කට සීමා නොකළහ. පෙබරවාරි, මාර්තු යනු මීකිරි දෙවෙන කාලයයි. එළදෙනුන්ට වැඩියෙන්ම පැටවුන් ලැබෙන්නේ මේ කාලයේදී බැවිනි. මේ කාරණයත් සමඟ දෙමළ මහා සංස්කෘතියෙන් අවුරුද්දට එකතු වූ චාරිත්‍රය වූයේ කිරි ඉතිරවීමයි. එය රමණීයව සිදුවිය.
නෙලාගත් අස්වනුවලින් අලුත් සහල් මංගල්‍ය පැවැත්වීම ද අලුත් අවුරුද්දට පෙර සිදුවේ. තවමත් ප්‍රාදේශීය වශයෙන් යම් දුරකට මේවා සිදුවුවද මහා සමාජයෙන් ඒවා බැහැර වී තිබේ. තෙල් වළං ළිප තැබීමේ නැකැත සම්පූර්ණයෙන්ම අත්හැරී ඇත. එය අවුරුදු සංඥාවම බැහැර කිරීමකි. මේ බැහැර කිරීම බොහෝ දුරට ලිත් "මොඩ්"මුද්‍රණය ඇරැඹීමත් සමඟ සිදුවිය. මුද්‍රිත ලිතේ ඉඩකඩ සීමාසහිත නිසා එවැනි ඇතැම් අවුරුදු චාරිත්‍ර බැහැර විය.
ජනශ්‍රැතියේ එන සිංහල අවුරුද්ද කෙතරම් අපූරුද ? කාලානුරූපීව අපිට කොයිදේටත් නිසියාකාරව සකස් වෙන්න ඕන. ඒ සකස්වීමත් එක්ක අපේ ආකල්පත් වෙනස් කරගන්න ඕන. ඒ හරහා ඔබටත්, මටත්, අපි හැමෝටමත් ප්‍රබෝධයෙන් මේ සිංහල අලුත් අවුරුද්ද සමරන්න හැකියාවක් ලැබේවි.

/නාලක දහනායක

# රට පෙරට ගෙනයන ඉදිකිරීම් කර්මාන්තය..



Eng. R.H. රුවිනිස්
සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

රටක ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ එක මායිමක් ලෙස ඉදිකිරීම් ක්ෂේත්‍රය සලකනු ලැබේ. ඒ අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රය යනු රටක ආර්ථික සංවර්ධන නිරූපනයේ එක් ධනාත්මක පැතිකඩකි.

මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන නිසි විවරණයක් සිදුවන්නේ 1977 වසරින් පසුවය. ඒ අනුව සංවර්ධනය වූ ඉදිකිරීම් කර්මාන්තයක් මගින් රටේ ආර්ථිකය වර්ධනයට සිදුවන ධනාත්මක බලපෑම කෙරෙහි අවධානය යොමුකරමින් එවකට පැවති රජය ලෝක බැංකු අරමුදලින්, එනම් 1986 වසරේදී ඉදිකිරීම් කර්මාන්තය සඳහාම වෙන්වූ ආයතනයක් ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන (CIDA) ආයතනය නමින් අරඹනු ලැබිණ.

## "විදෙස් රැකියා ඉලක්ක කරගෙන ඉදිකිරීම් ශිල්පීන්ට NVQ සහතික"

දෙස් විදෙස් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය, ඇගයීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල නියාමනයන් සම්පාදනය කිරීම හා නිර්නායකයන් සම්පාදනය කිරීම මෙම අයාතනය පිහිටුවීමෙන් බලාපොරොත්තු විය. එමෙන්ම ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය, නිවාස හා ගොඩනැගිලි සැලසුම් මධ්‍යස්ථානය හා ඉදිකිරීම් මෙහෙයුම් ශිල්පී විදුහල හරහා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල නෛතික පුහුණුව ලබා දීම සිදු කරනවා. ඒ අනුව ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය මගින් රටේ ශ්‍රම බලකායට අවශ්‍ය පුහුණු ශිල්පීන් 4,000ක් පමණ වසරකට පුහුණු කිරීම් සිදු කරනු ලැබේ.

ඊට අමතරව මෙම ආයතනය මගින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් ද සිදුකරනු ලැබේ.

මේ වනවිට ඉදිකිරීම් කර්මාන්තය මගින් අප රටේ දළ ජාතික නිෂ්පාදනයෙන් 10% - 15% අතර දායකත්වයක් සපයනු ලැබේ. එමෙන්ම ඍජුව හා වක්‍රව ලක්ෂ 15ක පමණ ප්‍රමාණයක් මෙම කර්මාන්තය හරහා ජීවනෝපාය සළසා ගනිති. ඉකුත් සමයේදී ලොවම ගිලගත් කොවිඩ් වසංගතය හා ආර්ථික කඩා වැටීම මෙරට ඉදිකිරීම් කර්මාන්තයටද දැඩි බලපෑමක් එල්ල කළේය.

එමඟින් සිදුවූයේ සියලු ඉදිකිරීම් කටයුතු නතර කිරීමට රජය තීරණය කිරීමයි. ඒ වනවිට කර්මාන්තය දිගටම පවත්වාගෙන යෑමට කොන්ත්‍රාත්කරුවන් බොහෝ පිරිසක් නව යන්ත්‍රෝපකරණ ද ගෙනවිත් තිබුණි. එම යන්ත්‍ර සූත්‍ර ලීසිං වාරික ගෙවීම, සේවක පඩි නඩි ගෙවා ගැනීමට නොහැකි තත්ත්වයක් මේ වනවිට ඇතිව තිබේ. ශ්‍රමිකයින්ගේ රැකියා අහිමි වූ පසු බොහෝ දෙනෙක් කොන්ත්‍රාත් ආයතනවලින් වන්දි ඉල්ලා තිබේ. එහෙත් අදාළ වන්දි මුදල් ගෙවීමට කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නැති තත්ත්වයකට මේ වනවිට ඇතිව තිබේ. එමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල අමුද්‍රව්‍ය මිල ඉහළ යාමත් මෙම ක්ෂේත්‍රයට එල්ලව තිබෙන අතුල් පහරකි.

## "CIDA ආයතනයෙන් වසරකට පුහුණු ශිල්පීන් 4000ක්"

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ යටතේ ලියාපදිංචිව සිටි කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව 6,000 කි. මේ වනවිට එම ලියාපදිංචි කිරීම 2,500 ක පමණ ප්‍රමාණයකට පහත වැටී තිබේ. ඉහතින් සඳහන් කළ ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට විශාල මුදලක් ගෙවීමට නියමිතව තිබුණි. ඒ මුදල් ගෙවීමට රජය එකඟ විය.

එමෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) මගින් මෙරටට ලැබෙන මුදල මගින් මෙරට ඉදිකිරීම් කර්මාන්තයේ නවමු පියවර රැසක් ගතහැකි වනු ඇතයි අපි විශ්වාස කරනවා. විදේශීය ණය දෙන ආයතන මගින් ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති 133ක් තිබෙනවා. ව්‍යාපෘති සඳහා දැනට මුදල් ගෙවීමට ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව එකඟ වී ඇත. භාණ්ඩාගාරයට බරක් නොවී ආයතනයේ ආදායම් ආයතනය මඟින්ම උත්පාදනය කර ගැනීමටද CIDA ආයතනය බලාපොරොත්තු වේ.

එමෙන්ම නිපුණතා තිබෙන ශ්‍රමිකයින් පරීක්ෂණයක් සිදු කර රැකියා වෙළඳපළට යොමු කිරීමට ද CIDA ආයතනය අලුත් වැඩසටහනක් ආරම්භ කර තිබේ. ඒ සඳහා ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව 18,000 කි. විශේෂයෙන්ම NVQ සහතිකයක් ඉදිකිරීම් ශ්‍රමිකයකුට ලබාදී එමගින් ඔහුගේ වෘත්තීය නිපුණතාවය උසස් කිරීමට හැකියාව ලැබේ. එමෙන්ම විදේශ රැකියා වෙළඳපොළට පහසුවෙන්ම ඇතුළු වීමට ඔහුට හැකියාව ලැබෙනු ඇත.

මෙම වැඩපිළිවෙල සැළසුම් කර ඇති ආකාරයටම ක්‍රියාත්මක කරගත හැකිවුවහොත් මෙරට ඉදිකිරීම් ක්ෂේත්‍රය් නව යුගයක අරුණළු උදාවනු ඇත.

# සිතට නිදහස සැමට නිවහන



Eng. K.A. ජානක
සාමාන්‍යාධිකාරී
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

නිවසක් යනු බිත්ති හතරකින් සහ වහලයකින් වෙන්වූ කුටීරයක් නොව ක්‍රමානූකූලව එකිනෙක හා සම්බන්ධ අවකාශයන්හි එකතුවක් බව අවබෝධකර ගැනීමේහිලා වූ බුද්ධිමය කතිකාවතක් සමාජය තුල ව්‍යාප්ත වෙමින් පවති.

2023 වසරේදී වැඩසටහන් රැසක් ආරම්භ කිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සැලසුම් කර තිබේ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ලෙස ප්‍රසන්න රණතුංග මහතා පත්වූ පසු උපදෙස් ලබා දුන්නේ නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නිම නොකළ නිවාසවල වැඩ අවසන් කරන ලෙසයි. ඒ අනුව මේ වසරේදී භාණ්ඩාගාර අරමුදල් ලෙස රුපියල් මිලියන 3,750 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ලැබුණි. එම මුදලින් 2020 වසරින් පසු ආරම්භ කළ මේ වනතෙක් අවසන් නොකළ ව්‍යාපෘති නිම කිරීමට අප ආයතනය සැලසුම් කර ඇත.

"ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 6,300ක වැඩ අවසන් කිරීමට මිලියන 2,253 පමණ මුදලක් වෙන් කර ඇති අතර "මිහිඳු නිවහන" වැඩසටහන යටතේ නිවාස 385ක වැඩ අවසන් කිරීමට රුපියල් මිලියන 98.39ක මුදලක් වෙන් කර තිබේ. එම නිවාසයන්හී වැඩ අවසන් කළ පසු 2020 ජනවාරි සිට 2022 දෙසැම්බර් 31 වැනිදා වනවිට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආරම්භ කළ සියළුම නිවාසවල ඉදිකිරීම් කටයුතු අවසන් වේ.

## "සැමට නිවහන ව්‍යාපෘතියෙන් නිවාස ඒකක 864ක්"

එය අවසන් කිරීමෙන් පසුව "සැමට නිවහන" යන තේමාව යටතේ මේ වසරේදී නව වැඩසටහනක් ආරම්භ කිරීම අපගේ සැලසුමයි. එම වැඩසටහන යටතේ නිවාස ඒකක 864ක් ඉදිකිරීම සඳහා මිලියන 648ක් වෙන් කර තිබේ.

තවද රුපියල් මිලියන 750ක මුදලක් යොදවමින් ප්‍රතිලාභීන් 1,500කට නිවාස ණය ලබා දීමේ වැඩසටහනක්ද ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

මේ සියල්ලට අමතරව ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන යටතේ නිවාස 760ක වැඩ අවසන් කිරීමට රුපියල් මිලියන 578ක මුදලක් මේ වසරේදී ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලයෙන් ලැබීමට නියමිතය. එම මුදල ලැබීමෙන් පසු එම නිවාස ඒකක සියල්ලෙහිම ඉදිකිරීම් කටයුතු මේ වසර අවසන් වනවිට නිම කිරීම අපගේ ඒකායන අරමුණයි. එම නිවාස ඒකකවල ජනතාව දිරිමත් කිරීමටත්, ඔවුන්ගේ යටිතල පහසුකම් නගා සිටුවීමටත් මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 76ක් මුදලක් අපට හිමිවිය.

"නගමු පුරවර" වැඩසටහන මඟින් නිවාස වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අපට රුපියල් මිලියන 50ක් ලැබුණි. ඒ අනුව හිඹුටුළයන නිවාස ව්‍යාපෘතියේ මළප්‍රවාහන පද්ධතිය නවීකරණය කරන්න එම මුදලින් සැලසුම් කර තිබේ. ජල සම්පාදන මණ්ඩලය හා එක්ව එය සිදු කරයි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර උත්පාදන හරහා එනම් ලබා දී ඇති ණය මුදල් නැවත අයකර ගෙන එම මුදලින් අලුත් ණය ලබා දීම සිදු කරයි. ඒ අනුව මේ වසරට ඒකක 1,000ක් සඳහා රුපියල් මිලියන 600ක් වෙන් කර තිබේ. නව නිවාස සදා ගැනීමට හෝ නිවාස වැඩිදියුණු කර ගැනීමට එමඟින් ජනතාවට අවස්ථාව උදාවේ.

## "ප්‍රතිලාභීන් 1500කට නිවාස ණය"

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක හිමිකම් ඔප්පු ලබා දීමේ වැඩසටහන වේගවත් කර ඇත. ඉඩම් කොමසාරිස් කාර්යාලය, ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතන සමඟ සම්බන්ධීකරණය හරහා ගැටළු නිරාකරණය කරමින් මේ වසරේදී හිමිකම් ඔප්පු 1500 - 2000 අතර ප්‍රමාණයක් ලබා දීමට අප සැලසුම් කර ඇත.

2007/2008 කාලවලදී ආරම්භ කළ සංවර්ධන වැඩසටහනක් පසුගිය කාලය පුරාවට ක්‍රියාත්මක නොවුණි. එම වැඩසටහන් නැවත ආරම්භ කිරීම සඳහා ඉන්දියානු සංවර්ධනකරුවෙක් වන සීඩීසී කාර්මික ඉන්ෆ්‍රාස් ආයතනය සමඟ පසුගිය වසරේ අවසන් භාගයේදී ගිවිසුම් ගත විය. ඒ හරහා අර්ධ සුඛෝපභෝගී නිවාස 560ක් ඉදිකිරීම එහි සැලසුමයි. වර්ග අඩි 685 කින් යුත් කාමර දෙකේ නිවාස 140ක් සහ කාමර තුනේ නිවාස 420 කුත් වශයෙන් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් අනුව සැලසුම් කළ පරිදි රටේ තිබෙන ආර්ථික තත්ත්වයටද මුහුණ දෙමින් මේ සියළු අභියෝග ජයගැනීම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අප සියළුම දෙනාගේ ඒකායන අරමුණ බවද විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

/අමිල දර්ශන හේරත්

# UDA மனித வள முகாமைத்துவப் பிரிவுக்கு ISO 9001:2015 தரச் சான்றிதழ்



**நகர அபிவிருத்தி அதிகார சபையின் மனித வள முகாமைத்துவப் பிரிவுக்கு ISO 9001:2015 தரச் சான்றிதழ் வழங்கியமை பற்றி பிரதி பணிப்பாளர் நாயகம் (மனித வள முகாமைத்துவம் மற்றும் நிர்வாகம்) டபிள்யூ.ஏ.எஸ். திரு.சுமணசூரியவுடனான கலந்துரையாடல்.**

நகர அபிவிருத்தி அதிகார சபையானது 1978 ஆம் ஆண்டு பாராளுமன்றத்தின் சட்டத்தில் இருந்து உருவானது. முக்கியமாக இந்த அதிகாரசபையின் நோக்கம் மக்கள் இலகுவாக வாழக்கூடிய வகையில் நகரங்களை உருவாக்குவதும், மக்களின் வாழ்க்கைக்குப் பாதிப்பில்லாத வகையில் நகர உருவாக்கத்தை எளிதாக்குவதுமாகும். இந்த அடிப்படையில் இதை நிறைவேற்ற, நகர அபிவிருத்தி அதிகாரசபையானது இலங்கை முழுவதும் உள்ள 9 மாகாணங்களை உள்ளடக்கிய 9 மாகாண அலுவலகங்களையும் 26 மாவட்ட அலுவலகங்களையும் கொண்டுள்ளது. இந்த கட்டமைப்பின் படி. நகர அபிவிருத்தி அதிகார சபையின் செயற்பாடுகளும் நகர திட்டமிடல் செயற்பாடுகளும் இடம்பெற்று வருகின்றன.

இந்த நகர திட்டமிடல் செயற்பாடுகள் நடைமுறைப்படுத்தப்படும் போது குறிப்பிட்ட சில சிக்கலான சூழ்நிலைகளுக்கு முறையான செயன்முறையைப் பேணுவதும் பொதுமக்களுக்குத் தேவையான சேவைகளை தொடர்ச்சியாக வழங்குவதும் அவசியம். பொதுமக்களின் பல்வேறு புகார்கள் மற்றும் குறைகளின் அடிப்படையில் இந்த முறையான செயல்முறையைப் பராமரிக்க வேண்டிய அவசியம் எழுகிறது. இந்த நிலைகளுடன் பொது மக்கள் தினத்தன்று, மக்களின் குறைகளைக் கேட்டறிந்து அவர்களின் தேவைகளை திறம்பட மற்றும் திறமையாக நிறைவேற்றுவதற்கு ஒரு நல்ல அமைப்பை தயாரிப்பதன் முக்கியத்துவத்தை நமது அமைச்சர் எமக்கு எடுத்துக்காட்டினார். அதன்படி, நிலையான இயக்க நடைமுறையைத் தயாரிக்க நாங்கள் முடிவு செய்கிறோம். அந்த நடைமுறையை அபிவிருத்தி செய்வதன் மூலம், பொதுமக்களின் தேவைகள் மற்றும் பிரச்சினைகளுக்கு ஏதேனும் ஒரு வகையில் உடனடி பதில்களை வழங்க முடியும். அதேபோல், பொதுத் தேவைகளைப் பூர்த்தி செய்ய அமைப்பினுள் பல்வேறு செயல்பாடுகளைச் செயல்படுத்த வேண்டும். அந்த நடவடிக்கைகள் செயல்படுத்தப்படும்போது, பொதுமக்களின் தேவைகளை நிறைவேற்றுவதில் தாமதம் ஏற்படலாம். அதைத் தடுக்கும் நோக்கத்துடன் இந்த நிலையான இயக்க நடைமுறையை நாங்கள் தயாரித்துள்ளோம்.

ISO என்ன செய்கிறது என்றால், நமது நிறுவன செயல்பாடுகள் உலகில் பொதுவாக ஏற்றுக்கொள்ளப்பட்ட நியம நடைமுறைகளின்படி அல்லது சர்வதேச முறைகளின்படி மேற்கொள்ளப்படுகிறதா இல்லையா என்பதைச் சரிபார்த்து, அந்த சர்வதேச முறைகளின்படி நிறுவனத்தின் நடைமுறைகள் மேற்கொள்ளப்படுகின்றன என்று உறுதியளிக்கிறது. அங்கு நமது முறைகள் சர்வதேச முறைகளுடன் ஒத்துப் போகின்றனவா என்று பார்க்கிறார்கள். நம்மிடம் குறைகள் இருப்பின், மீண்டும் அவற்றை நிவர்த்தி செய்ய வேண்டும். அதன் பின்னர், எமது நிறுவனத்தின் முறைகள் சர்வதேச முறைகளுடன் தயாரிக்கப்பட்டிருந்தால், அது உறுதிப்படுத்தப்பட்ட பின்னரே, நிறுவனத்தில் சர்வதேச ரீதியில் ஏற்றுக்கொள்ளப்பட்ட செயற்பாட்டு நடைமுறைகள் அமுல்படுத்தப்படுகின்றன என்பதற்கான ISO 9001 சான்றிதழை இலங்கை தர நிர்ணய நிறுவனம் வழங்கும். சர்வதேச அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட இயக்க நடைமுறைகள் எங்கள் நிறுவனத்தில் செயல்படுத்தப்படுகின்றன என்று அர்த்தம்.

இந்த ISO சான்றிதழை முழு அதிகார சபைக்கும் வழங்குவதே எங்களது அடுத்த நோக்கம். அதாவது சர்வதேச அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட நிலையான நடைமுறையை அறிமுகப்படுத்த வேண்டும். அதற்காக மனிதவள முகாமைத்துவப் பிரிவில் இருந்து முயற்சி எடுத்தோம். அதன்படி, ஆட்சேர்ப்பு, தேர்வு, பதவி உயர்வு, சம்பளம், பயிற்சி மற்றும் மேம்பாடு போன்ற அனைத்து விஷயங்களுக்கும் சர்வதேச அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட தரநிலை முறைகள் தயாரிக்கப்பட்டுள்ளன. அதற்கான அனுமதியை இலங்கை தர நிர்ணய நிறுவனத்திடம் பெற்றுள்ளோம். சர்வதேச மனித வள முகாமைத்துவ முறைகளை நாங்கள் இணைத்துள்ளோம். இது மற்ற துறைகளையும் ஊக்குவிக்கும் என நம்புகிறோம்.

> **"சர்வதேச அளவில் இயங்கும் மனித வள முகாமைத்துவ நுட்பங்களுக்கு ஏற்ப நாங்கள் எங்களை தகவமைத்துக் கொண்டுள்ளோம்."**

இங்கு அடுத்த கட்டமாக இந்த நிலையான செயல்பாட்டு நடைமுறைகளை நமது ஒவ்வொரு மாகாண அலுவலகத்திற்கும் அறிமுகப்படுத்தி இந்த சான்றிதழை வழங்க வேண்டும்.

இது மிகவும் திறமையான மற்றும் பயனுள்ள பொது சேவையை வழங்க எங்களுக்கு உதவுகிறது. நகர அபிவிருத்தி அதிகாரசபையின் காணி, வீடமைப்பு, தகவல் தொழில்நுட்பம் மற்றும் வன் ஸ்டொப் யுனிட் பிரிவுகளுக்கான ஆரம்பகட்ட பணிகள் இங்கு ஏற்கனவே ஆரம்பிக்கப்பட்டுள்ளன.

> **"எங்கள் அடுத்த நோக்கம் நகர அபிவிருத்தி அதிகார சபைக்கே இந்த ISO சான்றிதழைப் பெறுதல்."**

அதன் பின்னர் இம்மாத இறுதிக்கு முன்னர் யாழ்ப்பாணம், சப்ரகமுவ மற்றும் தென் மாகாண அலுவலகங்களில் இந்தப் பணிகள் ஆரம்பிக்கப்படும். இந்த வருட இறுதிக்கு முன்னர், நகர அபிவிருத்தி அதிகார சபையின் ஒவ்வொரு அலுவலகத்திற்கும் சர்வதேச ரீதியில் அங்கீகரிக்கப்பட்ட செயற்பாட்டு நடைமுறையை அறிமுகப்படுத்தி, இலங்கை தர நிர்ணய நிறுவனத்திடம் அனுமதி பெற்று ISO சான்றிதழைப் பெறுவோம்.

ISO சான்றிதழைப் பெறுவதற்கு, முதலில் இலங்கை தர நிர்ணய நிறுவனத்திடம் கோரிக்கை விடுத்தல் வேண்டும். பின்னர் அவர்கள் வந்து அந்த நிறுவனத்தின் நடைமுறை சர்வதேச அளவில் ஏற்றுக்கொள்ளப்பட்ட செயல்பாட்டு முறைப்படி உள்ளதா இல்லையா என்று பார்க்கிறார்கள். அதை சரிபார்த்த பின்னரே இந்த சான்றிதழ் வழங்கப்படுகிறது. அதற்கு, நிறுவனத்தின் ஊழியர்களின் அர்ப்பணிப்பு மற்றும் நல்ல தலைமைத்துவம் தேவை. சரியான தலைமை இருந்தால் மட்டுமே இந்த பணி வெற்றியடைய முடியும். வெற்றிகரமான அல்லது தோல்வியுற்ற வணிகத்தின் தோற்றத்தை பாதிக்கும் காரணி தலைமை. இந்தத் தரச் சான்றிதழைப் பெற எங்களுக்கு 6 மாதங்கள் ஆனது. இதனைப் பெறுவதற்கு எங்களுக்கு தலைவர் மற்றும் அமைச்சரிடமிருந்து கிடைத்த ஆதரவு சிறப்பாக இருந்தது.

முனீரா அபூபக்கர்



# මරදගහමුලටත් නව අරුණාළුව

මරදගහමුල සුළු සහ මධ්‍යම පරිමාණයේ සහල් ව්‍යාපාරයෙහි නිරත ව්‍යාපාරිකයෝ මෙරට සහල් සහ වී නිෂ්පාදනය වෙනුවෙන් සුවිශේෂී කාර්ය භාරයක් සිදුකරති. ඔවුන්ට ඒ වෙනුවෙන් තිස් වසරකට අධික ඉතිහාසයක් ඇත. නමුත් මේ ගෙවී ගිය සමස්ත කාලය පුරාවටම සහල් සහ වී ගබඩා කිරීම වෙනුවෙන් නිශ්චිත ස්ථානයක් නොමැතිවීමෙන් එම ව්‍යාපාරිකයෝ දැඩි ලෙස පීඩාවට පත්ව සිටියහ. පැවති රජයන් ගණනාවකින් ඒ සඳහා ස්ථිර විසඳුම් ඉල්ලා සිටියද, ඔවුන්ට ඒ වෙනුවෙන් ලැබුනේ පැලැස්තර විසඳුම් පමණි.

එබැවින් 2014 වසරේදී එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාව සිටි බැසිල් රාජපක්ෂ මහතා විසින් මරදගහමුල සුළු සහ මධ්‍යම පරිමාණයේ සහල් ව්‍යාපාරයෙහි නිරත ව්‍යාපාරිකයන් වෙනුවෙන් වී ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් හා සහල් වෙළෙඳ සංකීර්ණයක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම සිදු කළහ. ඒ සඳහා වෙන්කෙරුණු මුළු බිම් ප්‍රමාණය අක්කර දෙකහමාරකි.

මෙම වී ගබඩා සංකීර්ණය තුළ එකවර වී කිලෝ දෙලක්ෂ පනස් දහසක් පමණ ගබඩා කිරීමට පහසුකම් සලසා තිබේ. කිලෝ 80,000ක බර එකවර කිරා බැලිය හැකි බිම් තරාදිය, අඩි 40ක කන්ටේනර් ගමන් කළ හැකි මාර්ග, ගබඩා සඳහා ගිනිනිවන උපකරණ, ගබඩා තුළට ස්වභාවිකව එළිය ලැබෙන ලෙස සකස් කර ඇති වහල, සේවක ආපන ශාලාව, ජල විදුලිය වැනි පහසුකම් මෙම ගබඩා සංකීර්ණය තුළ අන්තර්ගත විය.

මෙහි ගබඩා කෙරෙන වී සහල් බවට පත්කර අලෙවි කිරීම සඳහා ඉදිකිරීමට නියමිතව තිබූ සහල් වෙළෙඳ සංකීර්ණයේ වෙළෙඳසැල් 115ක් ඉදිකිරීමට නියමිත විය. ඊට අමතරව වෙළෙඳුන් සඳහා අවශ්‍ය රථගාල්, විවේකාගාරයක්, ආපනශාලාවක් ද ඉදිකිරීමට නියමිතව තිබුණි.

නමුත් යහපාලන රජය යටතේ ක්‍රියාත්මකවූ ආර්ථික සංවර්ධන අමාත්‍යංශය විසින් 2015 වසරේදී අහෝසිකරනු ලැබුවා. ඒ සමගම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නතර කළේය. ඉදිකිරීම් කටයුතු අතරමඟ නතරවීම හේතුවෙන් මරදගහමුල මෙම සහල් ගබඩා සංකීර්ණය වල්බිහි වන්නට විය. එවකට ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ ඇමතිවරයා වූ පී. හැරිසන් මහතා ඉදිකිරීම් කටයුතු නතරවූ මෙම සහල් ගබඩා සංකීර්ණය දෙතුන්වරක්ම නිරීක්ෂණය කොට ඉදිකිරීම් කටයුතු ඉක්මනින් නිමකොට ජනතා අයිතියට පත්කරන බව මාධ්‍යයට ප්‍රකාශ කළහ. නමුත් එය වචනයට පමණක් සීමාවූ තවත් එක් පොරොන්දුවක්ම විය.

මේ අතරදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් මරදගහමුල සහල් ගබඩා සංකීර්ණයට අනුබද්ධිත සහල් විකිණීමේ වෙළඳ කුටි 115හි ඉදිකිරීම්වල ඉතිරි වැඩ අවසන් කරන ලෙසට නාගරික සංවර්ධන අධිකාරිය නිළධාරීන්ට උපදෙස් දුන්නේය.

මෙම වෙළඳ කුටි 115හි ඉතිරි වැඩ අවසන් කිරීම සදහා අවශ්‍ය රුපියල් මිලියන 115ක මුදලක් අනුමත කර ගැනීමට ඇමති ප්‍රසන්න රණතුංග මහතා විසින් කැබිනට් පත්‍රිකාවක්ද ඉදිරිපත් කර තිබේ. එම කැබිනට් පත්‍රිකාවට අනුව මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නතර කරන අවස්ථාව වන විට සැලසුම් ගාස්තු සහිතව සිදුකළ වැඩ සදහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රුපියල් 72,313,377.57 ක මුදලක් හා ඉංජිනේරු සංස්ථාවේ ආරක්ෂක සේවකයන්ගේ වැටුප්,අතිකාල හා අදාළ ස්ථානීය ජල, විදුලි බිල්පත් සදහා රුපියල් 13,573,777.72 වශයෙන් රුපියල් 85,887,155.29ක වියදමක් දැරීමට සිදුව තිබේ.

මරදගහමුල සහල් ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන්කර වෙළඳුන් හා ප්‍රදේශයේ වෙළෙඳ සංගම් සම්බන්ධ කරගනිමින් ජනතාවට ඵලදායි සේවයක් ලබාදීමට කටයුතු කරන ලෙසද අමාත්‍යවරයා නිළධාරීන්ට උපදෙස් දී තිබේ. කැබිනට් මණ්ඩලය විසින් අදාළ මුදල් ප්‍රතිපාදන අනුමත කළ සැණින්ම මෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතය.

ඒ අනුව තවත් එක් පොරොන්දුවක් බවට මෙතෙක් කල් පත්ව තිබූ මරදගහමුල සහල් ගබඩා සංකීර්ණයට අනුබද්ධිත සහල් විකිණීමේ වෙළඳ කුටි 115හි ඉදිකිරීම් කටයුතු නුදුරේදීම අවසන්වනු ඇත. එය වෙළඳුන් මෙන්ම ජනතාවද ලබන ජයග්‍රහණයක් බව නොකියාම බැරිය.

නාලක දහනායක




ඉදිකිරීම් නතරව ඇති වෙළඳ කුටි

# පරිසර හිතැති දරුවන් තනමු

## නාගරික සංවර්ධන අධිකාරියෙන් අත්වැලක්

රැම්සා තෙත් බිම් යනු ජෛව විවිධත්වයෙන් අනූණ වූ සොබාදහමේ අපූරු නිර්මාණයක් වන පරිසර පද්ධතියකි. ජීවයේ ගුණාත්මකභාවය පවත්වා ගෙන යාමට සහ සමාජ හා ආර්ථික සංවර්ධනයට එමගින් අනගි කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මෙලොව ඇති ඉතා වටිනා පරිසර පද්ධතියක් වන රැම්සා තෙත්බිම්වල වටිනාකම බැලූ බැල්මට එකවර අපට නොපෙනේ. නමුත් ඉතා ඕනෑකමින් එය පිළිබඳව අවධානය යොමුකර බලන විට එහි වටිනාකම හොඳින් වැටහී යයි.

රටේ අනාගතය භාර ගැනීමට සිටින පාසල් දරු දැරියන්ට ද රැම්සා තෙත්බිම් පද්ධතියේ වටිනාකම කියා දීම කාලීන වූ අවශ්‍යතාවයකි. එය අරමුණු කර ගනිමින් රැම්සා තෙත්බිම් සහ තෙත්බිම් උද්‍යාන පිළිබඳව මෙරට පාසල් දරු දැරියන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් නාගරික සංවර්ධන අධිකාරිය ආරම්භ කර තිබේ. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තෙත්බිම් උද්‍යාන දෙකක් ක්‍රියාත්මක වේ. ඒ බැද්දගාන තෙත් බිම් උද්‍යානය සහ කෝට්ටේ, කොටුබැම්ම තෙත් බිම් උද්‍යානයයි. මෙම උද්‍යාන දෙක පාසල් දරු දැරියන්ට නොමිලේ නැරඹීමටද මේ යටතේ අවස්ථාව ලබා දී තිබේ.

මේ යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල පරිසර නියමුවන් 100 කගේ සහභාගීත්වයෙන් මෙම තෙත්බිම් උද්‍යාන කේන්ද්‍ර කර ගනිමින් පරිසර නිරීක්ෂණ හා අධ්‍යයන වැඩසටහනක් පසුගියදා පැවැත්විණ. කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලය, නුගේගොඩ ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය, නුගේගොඩ රෝයල් සර්වියස් විද්‍යාලය, කළුබෝවිල දකුණු කොළඹ ජාත්‍යන්තර පාසල යන පාසල්වල පරිසර නියමු සිසු සිසුවියන් මේ සඳහා එක් වූහ. මෙය සංවිධානය කරලු ලැබුවේ නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයයි.

පරිසර නියමුවන් ප්‍රථමයෙන්ම බැද්දගාන තෙත් බිම් උද්‍යානයේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. පසුව ඔවුන් පැමිණියේ කෝට්ටේ, කොටුබැම්ම තෙත් බිම් උද්‍යානයටයි. එහිදී අධ්‍යයන හා දැනුවත් කිරීමේ වැඩසටහනකට ද ඔවුන් එක් විය. මෙහිදී මෙම සිසුන් කණ්ඩායම් ක්‍රියාකාරකම් වල ද නිරත වූ අතර තෙත් බිම් සංරක්ෂණය, නාගරික තෙත්බිම්, රැම්සා තෙත්බිම්, තෙත්බිම්වල වෙසෙන සතුන් සහ ශාක වැනි විවිධ කරුණු පිළිබඳව ඔවුන් දැනුවත් කෙරිණ. මෙම පරිසර නියමුවන් සඳහා "බැද්දගාන සොබා මිතුරෝ" සංගමයේ සාමාජිකත්වය ලබා දීම ද මෙහිදී සිදු කෙරිණ.

ලෝකය පුරා තෙත්බිම් ආරක්ෂා කර ගැනීම සඳහා අන්තර්ජාතික වශයෙන් වැදගත් තෙත්බිම්, ජාත්‍යන්තර රැම්සා තෙත්බිම් ලෙස නම් කරනු ලබන්නේ රැම්සා සම්මුතිය විසිනි. රැම්සා සම්මුතිය මගින් ප්‍රකාශයට පත් කර ඇති අන්තර්ජාතික රැම්සා තෙත් බිම් ප්‍රමාණය 2,471 කි. රැම්සා සම්මුතිය විසින් ශ්‍රී ලංකාවේ තෙත් බිම් 6 ක් රැම්සා තෙත් බිම් ලෙස නම් කර තිබේ. මෙරට රැම්සා තෙත්බිම් ලෙස නම් කර ඇත්තේ බුන්දල ජාතික වන උද්‍යානය, ආනවිලුන්දාව අභය භූමිය, බලපිටිය මාදුගඟ අභයභූමිය, මන්නාරම වාන්කලේ අභය භූමිය, කුමන අභය භූමිය සහ විල්පත්තුව ජාතික වන උද්‍යානයයි.

ශ්‍රී ලංකාවේ කොළඹ නගරය ද නාගරික තෙත්බිම් කලාපයක් ලෙස 2018 වසරේදී රැම්සා සම්මුතිය විසින් ප්‍රකාශයට පත් කර තිබේ. ජෛව විවිධත්වයෙන් අනූන මිනිස් මනස සුවපත් කරන ඉතා වටිනා රැම්සා පරිසර පද්ධතිය රැක ගැනීම අප සියලු දෙනාගේම ජාතික වගකීමකි. මෙය නිසි ලෙස කළමනාකරණය කරගතහොත් පාරිසරික හා ආර්ථික ප්‍රතිලාභ අත්කර ගැනීමද හැකි වේ.





නිහාර චාමික පෙරේරා

# හද අදි රේඛා



ඔබ
අල්ප බැල්මකින්
කල්පයක්
මා අවුලන

ස්වල්ප ප්‍රේමයක් පෙන්වා
මෙට්‍රික තොගය
සඟවන

කොච්චරද ඇහුවම
කොච්චරක්වත් නෑ කියන

හෙණ ගහනවද ආදරෙයි නම්
ආදරෙයි කිව්වම.....

යේෂා
ලයි ලැක්

## නුඹ....



හැඟුම්බර හිත
කඳුළු සැලුවද අපමණ
ජීවිතේ පුරාවට
පැතුවේ එකම ආදරයයි
හැම දින
එබැවින් මතු හැමදින
නොයනු මා හැර...
භාගයා

## ජීවිත...

විඳින විඳවන
අපේ ජීවිත
දිනක සදහට මැකී යනවා
සුවද පුරවපු වෛවර්ණ
දිවිය ද නොදැනීම
වියකිලා යනවා
නොමැරී නොතිබෙන
මැරෙන ජීවිත
ඔහේ පාවී ගලා යනවා
කවදා කොහොම ද
නොදැන සිටිමුත්
ඉන්නකල්
මිනිසුන් බව
අගවපල්ලා...
භාගයා

## ඉඩෝරය

හිතට බර වැඩි හීන ඔක්කොම
රහසේ ම හංගා
ජීවිතේ බර දරා ගන්නට
හිතට තටු ආවා...
තටු සිඳී ගිය කිරිල්ලියකට
හීන ඇහිඳින දා
මොනවට මං දුක් ගන්නෙ තව
හීන හිමි නැතුවා...
නික්ම යන්නට ලොවින් ලොවකට
පැතුම් ගිලිහෙන දා
හදා ගන්න ද කොහොම මේ හීන
හිතට දුක නැතුවා....
අහිමි වී ගිය වසන්තය ළඟ
තවත් හීන රන්දා
හඬා වැලපී මියෙන්න ද මා
හීන මියෙදුන දා...
දිල්

## ඉන්දීර

අයිතියක් නැතුවම
අයිතියකට පෙම් බඳින
රැලි නගන මා හඳ
නොපෙනෙනා නිසල පතුල නුඹ
ඔබේ සුසුම් පොදට පවා
උන් හිටි තැන් අමතක වන
ඉන්දීර නුඹයි
මා රහසේ පෙම් බඳින සඳ
දොළොස් මසක් තිබුනත්
තුන් මසකි වසන්ත කාලයට
ඒ බව දැනත් ඇලුම් නොකරයිද
ඒ සුන්දර සෘතුවට
ඉතින් ඉන්දීර අසම් මා
නුඹ මා සතු විය යුතුම ද
ඔබේ ආලය අවැසි නැත
දුර සිට බලා සැනසිය හැකිය මට
වී.එම්.ශිහාරා බංඩාර

## ප්‍රේමය

රිද්දන බව දැනත් සිනාසීම
ප්‍රේමය දැයි නොදනිමි...
රවටන බව දැන දැනත්
විශ්වාස කිරීම
ප්‍රේමය දැයි නොදනිමි...
අහිමි බව දැන දැනත් පේවීම
ප්‍රේමය දැයි නොදනිමි...
නොඑන බව දැන දැනත්
මග බැලීම
ප්‍රේමය දැයි නොදනිමි
උපුටා ගැනීම - මුහුණු පොත
(පියාපත)


City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
Magazine
තිළිණ නිර්මාල්
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය
10
Just watch City News Magazine EP 1
YouTube